# විදුලි බිලේ අර්බුදයට ස්ථිරසාර විසඳුමක්

**අශෝක අභයගුණවර්ධන**
ජ්‍යෙෂ්ඨ උපදේශක- සෙමා ආයතනය, අධ්‍යක්ෂ- සුනිත්‍ය බලශක්ති අධිකාරිය
විධායක අධ්‍යක්ෂ- බලශක්ති සංසදය
බලශක්ති සංසදය, 441/6, හයිලෙවල් පාර, ගංගොඩවිල, නුගේගොඩ
විද්‍යුත් තැපැල - eforum@sltnet.lk
දුරකථන : 5524613 / 5532188 / 2817710 / 0777-519072

ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයකට අනුව ලංකා විදුලි බල මණ්ඩලය විසින් නිවාස වලට ලබාදෙන විදුලිය සඳහා අය කරන ගාස්තු අඩු කර ඇත. එම නව ගාස්තු ක්‍රමය නොවැම්බර් මස පළවන දා සිට ක්‍රියාත්මක වේ. එහෙත් එමගින් විදුලි බල මණ්ඩලයට ලැබෙන ආදායම අඩුවේ. සිදුවන පාඩුව පියවා ගැනීම අවශ්‍ය බැවින් කර්මාන්ත සහ හෝටල් ක්ෂේත්‍ර සඳහා වූ විදුලි බිල ඊට අනුරූප ලෙස ඉහළ නංවා ඇත. මෙය පාරිභෝගිකයාගේ පැත්තෙන් සිට බලන විට කබලෙන් ලිපට ඇද දැම්මක් විය හැක. ඒ කර්මාන්ත වල වියදම ඉහල යාම නිසා බඩු මිළ ඉහළ යා හැකි බැවිනි. එය විදුලිය ඇති අයට පමණක් නොව විදුලිය නැති අයටද බලපායි.

වැඩිවන වියදම පියවා ගැනීම පිණිස නව විදුලි ගාස්තු ක්‍රමයක් විදුලි බල මණ්ඩලය විසින් හඳුන්වා දෙනු ලැබුයේ මෙම වසරේ මාර්තු මාසයේදිය. එහෙත් එම නව විදුලි ගාස්තු ක්‍රමයෙන් පාරිභෝගිකයන්ට අවාසි වන බව දක්වා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මානව හිමිකම් නඩුවක් ගොනුවිය. එම නඩුව විභාගයට ගත් අවස්ථාවේ දී වඩා සාධාරණ ගාස්තු ක්‍රමයක් සකස් කර ඉදිරිපත් කරන ලෙස අධිකරණය විසින් ලංකා විදුලි බල මණ්ඩලය වෙත නියෝග කරන ලදී. එම නියෝගයට අනුව ලංකා විදුලි බල මණ්ඩලය අළුතින් සකසා අධිකරණය වෙත ඉදිරිපත් කළ යෝජනාව මඟින් දුප්පත් පාරිභෝගිකයාගේ බිල තවත් ඉහළ නංවා තිබිණි. එබැවින් වෙනත් යෝජනාවක් සකසා යලි ඉදිරිපත් කරන ලෙස අධිකරණය දෙවන වරටත් ලංකා විදුලි බල මණ්ඩලය වෙත නියෝග කළේය. එම නියෝගයට අනුව විදුලි බල මණ්ඩලය ඉදිරිපත් යෝජනාවට පසුගිය දා ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතිය ලැබිණි.

විදුලිය නිපදවීමේ වියදම ඉහළ යාම තාවකාලික තත්වයක් නොවේ. ඉහළ යන තෙල් මිළ සමඟ විදුලිය නිපදවීමේ වියදම ද ඉහළ යයි. එබැවින් තාවකාලික විසඳුම් වලින් විදුලි බිලේ අර්බුදය විසඳිය නොහැක. මෙහිදී අවිධිමත් ලෙස තිරණ ගැනීම සුදුසු නොවන බැවින් විදුලි බිල සකස් කරන ආකාරය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

## ජලවිදුලිය සහ තාප විදුලිය

ශ්‍රී ලංකාවේ දැනට විදුලිය නිපදවනු ලබන්නේ ජල විදුලියෙන් සහ ඛනිජ තෙල් වලිනි. තෙල් බලාගාර වලට නිති පතාම තෙල් අවශ්‍යවේ. ඒ සඳහා තෙල් ආනයනය කිරීමට සිදුවේ. ලෝකයේ ඛනිජ තෙල් සම්පත ක්ෂය වී යයි. එබැවින් 2010-12 පමණ වන විට ලෝකයට තෙල් භාවිතයේ උපරිම අවස්ථාව පසු කිරීමට සිදුවනු ඇතැයි අනුමාන කෙරේ. එබැවින් ඛනිජ තෙල් වල මිළ සාමාන්‍ය වශයෙන් වාර්ශිකව ඉහළ යනු ඇත. ඊට අනුරූපව ඛනිජ තෙල් විදුලි වියදම ද දිගින් දිගටම ඉහළ යනු ඇත.

ජල විදුලිය නිපදවන්නේ ඉහළ ජලාශ වල ගබඩා වී ඇති ජලයෙනි. වැස්ස වලාහක දෙවියන්හට පින්සිදුවන්නට ඊට ඉන්ධන වියදමක් නැත. එහෙත් ජල විදුලි බලාගාර වලින් අවුරුදු පතා නිපදවන විදුලි ඒකක ප්‍රමාණය තිරණය වන්නේ ඒ අවුරුද්ද පුරා වැටෙන වැස්ස ප්‍රමාණයට අනුවය. ඉතා හොඳින් වැස්ස වැටෙන අවුරුද්දක විදුලි ඒකක 5500 ක් පමණ නිපදවිය හැකි වන අතර ඉතා වියලි වසරක නිපදවිය හැකි විදුලි ඒකක ප්‍රමාණය 3500 ක් පමණ වේ. ඒ අනුව දැනට ලංකාවේ තිබෙන විදුලි ඉල්ලුම සමඟ සැසඳීමේ දී ජල විදුලියෙන් ලබාගත හැකි විදුලි ඒකක ප්‍රමාණය විදුලි ඉල්ලුමෙන් 35% - 55% අතර ප්‍රමාණයක් වේ.

ලංකා විදුලිබල මණ්ඩලයේ තක්සේරුවට අනුව 2008 වියලි වර්ෂයකි. එබැවින් 2008 වර්ෂයේ දී අවශ්‍ය වන විදුලියෙන් 60% ක් පමණ ඛනිජ තෙල් වලින් නිපදවීමට සිදු වනු ඇත.

## පාඩු ලබන ලංකා විදුලිබල මණ්ඩලය

2006 හා 2007 වසර වල දී ලංකා විදුලිබල මණ්ඩලය පවත්වාගෙන යනු ලැබුවේ පාඩු ලබමිනි. අවුරුද්ද මුලදී ලංකා විදුලිබල මණ්ඩලය සිදු කළ තක්සේරුවට අනුව 2008 වසරේ මණ්ඩලයේ මුළු වියදම රු බිලියන 136 ක් පමණ වේ. එම වියදම් වලින් 75% ක්ම වැය වන්නේ ඛනිජ තෙල් මගින් විදුලිය නිපදවීම සඳහාය. මේ වසර මුලදී විදුලි ගාස්තු වැඩි කළේ 2008 වසරේදී වත් ලංකා විදුලිබල මණ්ඩලය පාඩු ලබන තත්වයෙන් මුදවාගැනීමටය. එහෙත් අවුරුද්ද මුලදී තිබූ ඛනිජ තෙල් වල මිළ අවුරුද්ද මැදදී සීඝ්‍රයෙන් ඉහළ ගියේය. මෑතකදී කළ තක්සේරුවකට අනුව අවුරුද්දේ විදුලි බල මණ්ඩලයේ මුළු වියදම රුපියල් බිලියන 160 ක් දක්වා ඉහළ යනු ඇත. ඒ අනුව දැනට තිබෙන ගාස්තු ක්‍රමයට අනුව පවා වසර අවසන් වන විට ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් බිලියන 30 ක පමණ අලාභයක් දරන්නට සිදුවනු ඇත. අවුරුද්ද මුලදී විදුලි ගාස්තුව වැඩි නොකළානම් මණ්ඩලයට සිදුවන පාඩුව රුපියල් බිලියන 70 ක් දක්වා ඉහළ යනු ඇත. එසේවුවහොත් පසුගිය වසර තුන ඇතුලත මණ්ඩලයට සිදුවන මුළු පාඩුව රුපියල් බිලියන 100 ඉක්මවනු ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ මෙම පාඩුව පියවා ගැනීමට රජය විසින් සහනාධාර සැපයීම නුවණක්කාර වැඩක් නොවේ. එවිට විදුලිය ඇති වරප්‍රසාදලත් ජනතාවට සහනාධාර ලබාදීම සඳහා විදුලිබලය නොලැබෙන පිරිසට ද දායකවීමට සිදුවේ. ඒ රජයට ගෙවන බදු මාර්ගයෙනි. එය සිදු නොකළ යුතුය. මේ අනුව වසරක කාලය තුළ ලංකා විදුලිබල මණ්ඩලය සිදුකරන සම්පූර්ණ වියදම පියවා ගැනීමට නම් දැනට තිබෙන තත්වයට අනුව විදුලි ඒකකයක් විකිණිය යුතු සාමාන්‍ය මිළ රුපියල් 13.80 සිට රුපියල් 18.54 දක්වා වැඩි කළ යුතුය. නැතිනම් නාස්තිය අඩු කර ඛනිජ තෙල් වලින් විදුලිය නිපදවීම සීමා කළ යුතුය. ඒ සඳහා නාස්තිය අඩු කිරීමට බල කරන ගාස්තු ක්‍රමයක් හඳුන්වාදිය යුතුව ඇත.

## ක්ෂේත්‍ර අනුව විදුලි බිල වෙනස්

ලංකා විදුලිබල මණ්ඩලයේ ගාස්තු ක්‍රමය ක්ෂේත්‍ර 7 කට බෙදා ඇත. එම ක්ෂේත්‍ර වල පරිභෝජනය ගෘහස්ථ- 32%, ආගමික- 1%, පොදුකාර්යය- 18%, හෝටල්- 1%, කර්මාන්ත- 32%, ලංකා විදුලිබල සමාගම (ලෙකෝ) - 14%, වීදි විදුලි ලාම්පු- 1% යන අයුරින් බෙදී ඇත.

සමස්තයක් ලෙස විදුලි බල මණ්ඩලයේ ඒකකයක සාමාන්‍ය මිළ රු 13.80 වන විට ඇතැම් ක්ෂේත්‍ර වල සාමාන්‍ය ඒකක මිළ ඊට අඩුය. අනෙක් ක්ෂේත්‍ර වල සාමාන්‍ය ඒකක මිළ ඊට වැඩිය. ඒ අනුව ඒකක මිළ වැඩි ක්ෂේත්‍ර වලින් ඒකක මිළ අඩු ක්ෂේත්‍ර වලට සහනාධාරයක් ලැබේ. 2008 නොවැම්බරයේ සිට ක්‍රියාත්මක වන විදුලි ගාස්තු ක්‍රමයට අනුව හෝටල්, කර්මාන්ත සහ පොදු කාර්යය ක්ෂේත්‍ර වල ඒකක මිල ඒකක සාමාන්‍ය අගයට වඩා වැඩිය. එහෙත් මින් පෙර කර්මාන්ත ක්ෂේත්‍රයෙන් අය කළේ සාමාන්‍ය අගයට වඩා අඩු ගාස්තුවකි. මෙම නොවැම්බරයේ සිට ක්‍රියාත්මක වන ගාස්තු ක්‍රමය අනුව කර්මාන්ත සඳහා අය කරන සාමාන්‍ය විදුලි ගාස්තුව රු 14.20 දක්වා ඉහළ ගොස් ඇත. මින් පැහැදිලිවන්නේ විදුලි බල මණ්ඩලයට ක්ෂේත්‍ර අතර සහනාධාර ලබාදීම පිළිබඳව පැහැදිලි ප්‍රතිපත්තියක් නැති බවය. එලෙස පැහැදිලි ප්‍රතිපත්තියක් නොමැතිව සිතෙන සිතෙන වෙලාවට ක්ෂේත්‍ර අතර ගාස්තු අනුපාතය වෙනස් කිරීමෙන් රට ඇද වැටෙන්නේ මහ විපතකටය.

ඊට අමතරව එක ක්ෂේත්‍රයක ආයතන වෙනත් ක්ෂේත්‍රයකට දමා විදුලි බිල ඒ අනුව අයකරගැනීමෙන් ද අක්‍රමිකතා සිදුවේ. ප්‍රභූන්ට සේවා සපයන ලංකාවේ තරු පහේ හෝටල් කර්මාන්ත ක්ෂේත්‍රයට දමා විදුලි බිල හරහා සහනාධාර ලබාදෙන්නේ එබැවිනි. අනෙක් අතින් රජයේ ආයතන පොදු කාර්යය ක්ෂේත්‍රය යටතට ගැනෙන්නේ නම් එම ක්ෂේත්‍රයෙන් ඉහළ ගාස්තු අයකිරීමෙන් ද ලංකා විදුලි බල මණ්ඩලය කරන්නේ විදුලිබල පහසුකම් ලබාගත නොහැකි කොටස් වලින්ද වක්‍ර අන්දමින් ගාස්තු අයකිරීමයි. ඒ එම බිල් රජයේ වියදමක් වන නිසාය.

එක ක්ෂේත්‍රයක් විසින් තවත් ක්ෂේත්‍රයකට විදුලි ගාස්තුව හරහා සහනාධාර ලබාදිය යුතු නොවේ. කිසියම් ක්ෂේත්‍රයකට එම ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා සහනාධාර අවශ්‍ය නම් එය වෙනමම රජය විසින් කළ යුත්තකි.

## ගෘහස්ථ ක්ෂේත්‍රයේ පරිභෝජනය

ගෘහස්ථ ක්ෂේත්‍රයේ පරිභෝජනය සමාකාර ලෙස ව්‍යාප්ත වී නැත. සුළු පිරිසක් වැඩියෙන් විදුලිය පාවිච්චි කරති. ගෘහස්ථ අංශයේ පරිභෝජනයෙන් 23% ක්ම පරිභෝජනය කරනු ලබන්නේ පරිභෝගිකයන්ගෙන් 6% ක් විසිනි. අනෙක් අතට පාරිභෝගිකයන්ගෙන් 75% ක් පමණ පරිභෝජනය කරන්නේ ගෘහස්ථ අංශයේ පරිභෝජනයෙන් 50% ත් අඩුවෙනි. ජනනය කරනු ලබන ජලවිදුලිබල ඒකක සියලුම ක්ෂේත්‍ර අතර සමානුපාතිකව බෙදී යන්නේ යැයි අප උපකල්පනය කළහොත් ඒ එක් එක් ක්ෂේත්‍රයේ ඉල්ලුමෙන් 40%-50% ක ප්‍රමාණයක් සැපයෙන්නේ ජල විදුලි බලයෙනි. ඒ අනුව මසකට ඒකක 90 ට අඩුවෙන් පරිභෝජනය කරන ගෘහස්ථ අංශයේ පාරිභෝගිකයන්ගේ පරිභෝජනය ජලවිදුලිබලයෙන් සම්පූර්ණයෙන්ම සපුරාලිය හැකි බව මින් පෙනේ. එබැවින් මසකට ඒකක 90 ට අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන කාණ්ඩයෙහි මාසික විදුලි බිල තෙල් මිල වැඩිවීමත් සමඟ ඉහළ දැමීමේ අවශ්‍යතාවක් නැත.

ගෘහස්ථ අංශයේ පරිභෝජනය බෙදීයෑම




## එකම විසඳුම නාස්තිය අඩු කිරීමයි.

විදුලිය මූලික අවශ්‍යතාවයකි. එහෙත් භාවිතා කරන විදුලි උපකරණය අනුව එය සුඛෝපභෝගී අවශ්‍යතාවයක් ද විය හැක. එබැවින් භාවිතා කරනු ලබන විදුලි උපකරණ අනුව මූලික, මධ්‍යස්ථ හා සුඛෝපභෝගී යන ලෙසට ගෘහස්ථ ක්ෂේත්‍රයේ විදුලි පාරිභෝගිකයන් වර්ග කළ හැකිය. අද දවසේ මනුෂ්‍යයකුගේ මූලික අවශ්‍යතාව ලෙසින් සැලකිය හැක්කේ සවස් කාලයේ 6 හා 9 අතර විදුලි ආලෝකය ලබාගැනීම හා රූපවාහිනිය නැරඹීමයි.

අඩුවෙන් විදුලිබලය පරිභෝජනය කරන නිවසක භාවිතා කරන විදුලි උපකරණ ලෙස ප්‍රදීප්ත පහන්, සී එෆ් එල් බල්බ, ගුවන් විදුලිය, වර්ණ රූපවාහිනිය, විදුලි පංකාව, ශීතකරනය, විදුලි ඉස්තිරික්කය සහ රයිස් කුකරය ආදිය සැලකිය හැක. ඒ අනුව නිවසක මූලික අවශ්‍යතාවය මසකට ඒකක 90 ක් ලෙසින් සැලකිය හැකි වල අතර ගෘහස්ථ අංශයේ පාරිභෝගිකයන්ගෙන් 75% ක්ම මෙම ගණයට අයත්වේ. මධ්‍යස්ථ ගෘහස්ථ පාරිභෝගිකයා එම උපකරණම වැඩි කාලයක් භාවිතා කරයි. මිට අමතරව භාවිතා කරන විදුලි උපකරණය වන්නේ රෙදි සෝදන යන්ත්‍රයයි. මධ්‍යස්ථ පාරිභෝගිකයකුගේ පරිභෝජනය මසකට ඒකක 150 ට අඩුය. පාරිභෝගිකයන්ගෙන් 94% ක් පමණ අයත් වන්නේ මෙම ගණයටය. එබැවින් මසකට ඒකක 150 ට අඩුවෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයන්හට හැකි රැකවරණයක් ලබාදිය යුතුය.

විදුලිය වැඩියෙන් නාස්ති කරන්නේ 6% ක පමණ වූ ගෘහස්ථ පාරිභෝගිකයන් වන බැවින් ඔවුන් මෙල්ල කිරීමට වහාම පියවර ගත යුතුය. දැනට පවත්නා ගාස්තු ක්‍රමයට විකල්පයක් ඉදිරිපත්

කිරීමේදී මේ පිළිබඳව සැලකිල්ල යොමු කළයුතුය. ලෝකයේ පොසිල ඉන්ධන වල මිළ ඉහළ යෑමේ ප්‍රශ්ණයට පිළිතුර වන්නේ නාස්තිය අඩු කිරීමයි. එනම් බලශක්ති සංරක්ෂණයයි. බලශක්ති සංරක්ෂණ ප්‍රයත්නයන් ඇරඹිය යුත්තේ ඉහළ පරිභෝජනයත් ඇති කණ්ඩායමෙනි. නාස්තිය අඩු කිරීමේ හොඳම මෙවලම විදුලි ගාස්තු ක්‍රමයයි. ඒ බව පසුගිය ගාස්තු සංශෝධනයේ දී ඉතා හොඳින් පැහැදිලි විය. විදුලි ඉල්ලුමේ වර්ධන වේගය 7% සිට 3% දක්වා පහත වැටුනේ මෑතකාලයේ දී හඳුන්වා දුන් ගාස්තු ක්‍රමයට පින්සිදුවන්නටය. එහෙත් එම ගාස්තු ක්‍රමය පවා පොහොසත් පාරිභෝගිකයන්හට යන්තමින් වත් දැනී නැත. එබැවින් බලශක්තිය සංරක්ෂණය කිරීමට දිරිගැන්වීම උදෙසා ඇඟට දැනෙන ගාස්තු ක්‍රමයක් විදුලිය වැඩියෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයන් සඳහා හඳුන්වා දිය යුතුය. ඒ මිස නිවාස ක්ෂෙත්‍රයේ බර වෙනත් ක්ෂෙත්‍රයක් මත පැටවීමට යන්නේ නම් ප්‍රශ්න තව තවත් සංකීර්ණ කිරීමට හේතු විය හැක. එමෙන්ම අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන දුප්පතුන්ගේ විදුලි බිල ද වැඩි නොකළ යුතුය.

## වත්මන් විදුලි ගාස්තු ක්‍රමයේ ගැටළු

2008 මාර්තුවට පෙර පැවති ගාස්තු ක්‍රමයේ දී වැඩියෙන් විදුලිය පරිභෝජනය කරන නිවාස වලට වුවද බිලේ මුල් විදුලි ඒකක ප්‍රමාණය ලබාදුන්නේ අඩු මිළකටය. එනම් අඩුවෙන් විදුලිය භාවිතා කරන නිවාස වලට ලබා දෙන ඒකක මිළටමය. එහෙත් 2008 මාර්තුවෙන් පසු එම ක්‍රමය වෙනස් කර වැඩියෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයාගේ සියළු ඒකක එම කාණ්ඩයේ ඒකක ගාස්තුවට අනුව ලබාදීමට තිරණය විය. එහි තිබෙන ප්‍රධාන ගැටළුව නම් එක කාණ්ඩයක සිට ඊට ඉහළ කාණ්ඩයට පාරිභෝගිකයකු මාරුවන විට විදුලි බිල විශාල ලෙස ඉහලයාමයි. එය එම ගාස්තු ක්‍රමයේ තිබූ ප්‍රධානතම දුර්වලතාවයයි. මෙම තත්වය වෙනස් කිරීම සඳහා අධිකරණයේ නියෝගය මත විදුලි ගාස්තු යලිත් පැරණි කාණ්ඩ අයකිරීමේ ක්‍රමයටම නොවැම්බර් මස සිට වෙනස්වේ. එමඟින් එක වර සිදුවන විශාල පිම්ම අඩුවන නමුත් නව ගාස්තු ක්‍රමය මඟින් වැඩියෙන් විදුලිය භාවිතා කරන සල්ලිකාර පාරිභෝගිකයන්ට ද විශාල සහන ලැබී ඇත. මේ නිසා බලශක්ති සංරක්ෂණයට පාරිභෝගිකයා තුළ ඇති වන උනන්දුව තුනී වී යයි. එවිට විදුලි ඉල්ලුම ඉහළ යන අතර ඉන් විදුලි බල මණ්ඩලයටත් රටටත් විශාල පාඩුවක් සිදුවේ. ඒ වැඩි වැඩියෙන් පිටරටින් තෙල් ගෙන්වා ඒවා දහනය කර විදුලිය නිපදවීමට සිදුවීම නිසාය. එම නිසා නොවැම්බර් මස සිට ක්‍රියාත්මක වන විදුලි බල මණ්ඩලයේ නව ගාස්තු ක්‍රමය රටට ඉතා වාසිදායක නොවේ. එම නිසා ඊට විකල්ප විදුලි ගාස්තු ක්‍රමයකට වහාම අවතීර්ණ විය යුතුය.

පැවති විදුලි ගාස්තු ක්‍රමයේ අනෙක් දුර්වලතාව වුයේ සමාජයේ මධ්‍යම ආදායම් ලබන කණ්ඩායම අයත්වන ඒකක 91-150 පරිභෝජනය කරන කොටස සඳහා විශේෂ රැකවරණයක් නොමැතිවීමයි. අනෙක් ගැටළුව නම් බිලෙහි ඇතුලත් ස්ථාවර ගාස්තුව නිසා අඩු ඒකක ප්‍රමාණයක් මාසකට පරිභෝජනය කරන පාරිභෝගිකයන්ගේ ශුද්ධ ඒකක මිළ ද ඉහළ මට්ටමක පැවතීමයි.

## විකල්ප යෝජනාව - කාණ්ඩ ව්‍යුහය වෙනුවට ඒකක ගාස්තුව ක්‍රමානුකූලව ඉහළ නැංවීම

ගෘහස්ථ අංශයේ විදුලි බිලෙහි ප්‍රධාන කොටස් 3 ක් පවතී. එනම් ස්ථාවර ගාස්තුව, ඒකක ගාස්තුව හා ඉන්ධන ගැලපුම් ගාස්තුවයි. මින් ස්ථාවර ගාස්තුව හා ඉන්ධන ගැලපුම් ගාස්තුව අදාල වියදම් නිසි ලෙස පිළිබිඹු නොකරයි. ඉන්ධන මිළ අනුව අඩුවැඩිවීමක් නොමැති බැවින් ඉන්ධන ගැලපුම් ගාස්තුව හුදෙක් ඒකක ගාස්තුවේ කොටසක් පමණක් වේ. ස්ථාවර ගාස්තුව සඳහා සාමාන්‍ය අගයක් භාවිතා කරනු ලබන්නේ නම් එය පරිභෝජනය කරනු ලබන ඒකක සංඛ්‍යාව අනුව වෙනස් නොවිය යුතුය. එහෙත් විදුලි බල මණ්ඩලය විසින් එක් එක් පාරිභෝගික කාණ්ඩය සඳහා එක් එක් ස්ථාවර ගාස්තු අය කිරීමෙන් පෙනී යන්නේ ස්ථාවර ගාස්තුවට අර්ථයක් නැති බවයි. පාරිභෝගිකයාට වැදගත් වන්නේ අවසාන විදුලි බිල මිස එහි උප කොටස් නොවේ. ඒ නිසා ස්ථාවර ගාස්තුව සහ ඉන්ධන ගැලපුම් ගාස්තුව නැති කර ඒකක ගාස්තුව පමණක් අය කිරීම වඩා සුදුසු වේ.

මාසිකව පරිභෝජනය කරන ඒකක ගණන සමඟ ඒකකයක ගාස්තුව ද ක්‍රම ක්‍රමයෙන් ඉහළ යන්නේ නම් විදුලි ගාස්තු ක්‍රමයේ සියළු ප්‍රශ්න එක විට විසඳිය හැකි වේ. ඊට ඒකක ප්‍රමාණය මත පදනම් වූ සරල සූත්‍රයක් භාවිතා කළ හැක. එය දැනට පවතින ගාස්තු ක්‍රමයට වඩා ඉතා සරලය. එහිදී පළමු ඒකක 30 හේ මිළ කීයද දෙවන ඒකක 30 හේ මිළ කීයද ආදී වශයෙන් සොයන්නට නැත. එමෙන්ම ස්ථාවර ගාස්තුව කීයද ඉන්ධන ගැලපුම් ගාස්තු කීයද යනාදිය ද සොයන්නට අවශ්‍ය නැත. මතක තබාගතයුත්තේ එක් නියත අගයක් පමණි.

එම සරල සූත්‍රය නම්

ඒකක ගාස්තුව = an
එහි n යනු මසකට පරිභෝජනය කරනු ලබන ඒකක සංඛ්‍යාව
a යනු නියතකි
ඒ අනුව මාසික බිල්පත = $an^2$

මෙම සූත්‍රය අනුව මාසික පරිභෝජනය වැඩිවීමත් සමග ඒකකයක මිළ ක්‍රම ක්‍රමයෙන් වැඩිවේ.

දැනට තිබෙන මාසික බිල් වල හදිසි වෙනසක් සිදුවීම වැලැක්වීම සඳහාත් ජල විදුලි බලයේ වාසිය අඩුවෙන් පරිභෝජනය කරන අයට ලබා දීම සඳහාත් මෙම සූත්‍රය කොටස් දෙකකින් යොදාගත හැක. මෙහි පළමු කොටස මසකට ඒකක 90 ක් හෝ ඊට අඩුවෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයින් සඳහාය. ඔවුනට ජල බලය මඟින් විදුලිය සැපයිය හැකි බැවින් එක් නියතයක් යොදා ගැනේ. දෙවැනි කොටස යොදාගැනෙන්නේ මසකට ඒකක 90 ට වඩා පරිභෝජනය කරන පාරිභෝගිකයන් සඳහාය. එම කොටස සඳහා වෙනත් නියත අගයක් යොදා ගැනේ.

1 වැනි කොටස - මසකට ඒකක 90 ක් හෝ ඊට අඩුවෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයන් සඳහාය
ඒ සඳහා a = 0.07 ලෙස 2008 වසර සඳහා යොදාගත හැක.
එවිට මාසික බිල්පත = $0.07 \times n^2$

2 වැනි කොටස - මසකට ඒකක 90 කට වැඩියෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයන් සඳහාය.
එහිදී 2008 වසර සඳහා a = 0.093 ලෙස යොදාගත හැක. 1 වන කොටස සමඟ ගැලපීම සඳහා තවත් නියත අගයක් මෙහිදී බිලෙන් අඩු කරනු ලැබේ. එය 200 ලෙස 2008 වසර සඳහා යොදාගත හැක.

මාසික බිල්පත = $0.093 \times n^2 - 200$

මෙම යෝජනාව යටතේ ඒකකයක ගාස්තුව භාවිතා කරන විදුලි ඒකක ගණන අනුව තීරණ වේ. භාවිතා කරන ඒකක ගණන ඉහළ යනවිට ඒකකයකට අයකරන ගාස්තුව ද ක්‍රමානුකූලව රු: 50/= දක්වා ඉහළ යයි. ඒකකයක මිළ රුපියල් 50 දක්වා පැමිණි කළ ඒකක මිළ එම අගයේ නැවැත්විය හැක. මෙය 2008 සඳහා නිර්දේශිත අගයකි. මෙම විකල්ප යෝජනාව තුළින් මසකට ඒකක 180 ට අඩුවෙන් පරිභෝජනය කරන සියළුම පාරිභෝගිකයනට දැනට වඩා අඩු මිළට විදුලිය ලබාගතහැකි වේ. එමෙන්ම විදුලිය නාස්ති කරන පාරිභෝගිකයන්ගේ ඇඟට දැනෙන ලෙස විදුලි ඒකකයක මිළ ඉහළ නැංවීමට ද හැකිවේ.

මෙම විකල්ප යෝජනාව, නොවැම්බර් සිට තිබෙන ගාස්තු ක්‍රමය සහ පැවති ගාස්තු අතර සංසන්දනයක් ප්‍රස්ථාරයෙන් දැක්වේ.




මෙම ප්‍රස්ථාරයට අනුව පෙනීයන්නේ මාසයකට විදුලි ඒකක 170කට අඩුවෙන් විදුලිය භාවිතා සියළුම පාරිභෝගිකයන්ගේ විකල්ප විදුලි බිල නොවැම්බරයේ සිට ක්‍රියාත්මක වන විදුලි බිලට වඩා ඉතා අඩු බවයි. එය ප්‍රස්තාරයේ තිත් ඉරත් කඩඉරත් අතර වෙනසින් පැහැදිලි වේ. එහෙත් මෙහි ඇති විශේෂත්වය නම් මෙම විකල්ප යෝජනාවේ ගාස්තු අඩු කිරීමේ බර විදුලි බල මණ්ඩලයට හෝ වෙනත් ක්ෂෙත්‍රයකට පැටවෙන්නේ නොමැති වීමයි. එම හිඟ මුදල අය කරගන්නේ විදුලිය නාස්ති කරන අතලොස්සක් වූ පොහොසත් පාරිභෝගිකයන්ගෙනි.

## පොදු කාර්යය, හෝටල් හා කර්මාන්ත ක්ෂෙත්‍ර

පොදුකාර්ය, හෝටල් හා කාර්මික ක්ෂෙත්‍ර සඳහා වූ වත්මන් ලං.වි.ම. ගාස්තු ක්‍රමය අනුව විශාල පරිමාණයේ පාරිභෝගිකයන් ගෙන් අඩු ඒකක ගාස්තුවක් අයකරනු ලබන අතර කුඩා පරිමාණ පාරිභෝගිකයන්ගෙන් වැඩි ඒකක ගාස්තුවක් අය කරනු ලැබේ. මෙම ඒකක ගාස්තුව පරිභෝජනය කරන මුළු ඒකක සංඛ්‍යාවට අනුව වෙනස් නොවේ. මෙම ක්ෂෙත්‍රවල මුළු පාරිභෝගිකයන්ගෙන් 80%ක් ම වැටෙන්නේ කුඩා පරිමාණ පාරිභෝගිකයන් ගේ ඝනයටයි. එහෙත් එම පාරිභෝගිකයන්ගෙන් වැඩි ගාස්තුවක් අය කරන්නේ මන්දැයි ලං.වි.ම. පෙන්වා දී නැත.

ඇත්ත වශයෙන්ම මෙම ක්ෂෙත්‍ර වල සහන මිළට විදුලිය ලබාදිය යුතු කළයුතු කණ්ඩායම් ගෘහස්ථ ක්ෂෙත්‍රයේ දී මෙන් පරිභෝජනය කරන ඒකක ගණන අනුව තීරණය කළ නොහැක. ඒ සපයන සේවාව අනුව අවශ්‍ය කරන විදුලි ඒකක ප්‍රමාණයත් නිශ්පාදනයේ අත්‍යාවශ්‍යභාවයත් තීරණය කළ නොහැකි වන බැවිනි. එබැවින් ඒ එක් එක් අංශයේ සියලුම පාරිභෝගිකයන්ගෙන් සමාන ඒකක මිළක් අයකළයුතු බවට අප විසින් යෝජනා කරනු ලැබේ. මෙයින් ලං.වි.ම. මුළු ආදායමේ අඩුවීමක් නොමැතිව, පොදු කාර්ය ක්ෂෙත්‍රයේ පාරිභෝගිකයන්ගෙන් 97% කගේ ද, හෝටල් ක්ෂෙත්‍රයේ පාරිභෝගිකයන්ගෙන් 78% කගේ ද හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පාරිභෝගිකයන්ගෙන් 85% කගේ ද විදුලි ගාස්තු අඩුවනු ඇත. සපයන භාණ්ඩය හෝ සේවාව හෝ සඳහා වෙළඳ පොල තුළ සාධාරණ ඉඩකඩක් ලබාගැනීමට හැකි වන්නේ නිශ්පාදකයන් සියල්ලටම විදුලි සැපයුමේ දී සමානව සලකන්නේ නම් පමණි.

වගුව : පොදු කාර්යය, හෝටල් හා කාර්මික අංශ සඳහා වූ වත්මන් හා යෝජිත විකල්ප ගාස්තු ක්‍රමය.

| | පැවති ඒකක මිළ (ඉන්ධන ගැලපුම සහිතව) ඒකකයට රුපියල් | නොවැම්බරයේ සිට පවතින ඒකක මිළ (ඉන්ධන ගැලපුම සහිතව) ඒකකයට රුපියල් | **යෝජිත එකක ගාස්තුව (ඉන්ධන ගැලපුමක් නැත) ඒකකයට රුපියල්** |
|---|---|---|---|
| **පොදු කාර්යය** | | | |
| ජීපී 1: කුඩා | 19.50 | 19.50 | 18.70 |
| ජීපී 2: මධ්‍යම | 17.94 | 17.94 | 18.70 |
| ජීපී 3: විශාල | 17.68 | 17.68 | 18.70 |
| **හෝටල්** | | | |
| එච්1: කුඩා | 19.50 | 19.50 | 14.60 |
| එච්2: මධ්‍යම | 17.94 | 17.94 | 14.60 |
| එච්2: මධ්‍යම 1 | 10.68 | 12.09 | 14.60 |
| එච්3: විශාල 1 | 10.53 | 11.83 | 14.60 |
| **කර්මාන්ත** | | | |
| අයි 1: කුඩා | 13.00 | 13.65 | 12.15 |
| අයි 2: මධ්‍යම | 10.53 | 12.09 | 12.15 |
| අයි 3: විශාල | 10.40 | 11.83 | 12.15 |

තෙල් අවසන් වෙමින් පවතින නිසා ලෝකය වර්තමානයේ දී මුහුණ දී ඇති බලශක්ති අර්බුදය ජනතාවගෙන් වසන් කළ නොහැක. කවුරු බලයේ සිටියත් කවුරු විදුලි බල මණ්ඩලයේ කලමනාකාරිත්වයේ සිටියත් මෙම අර්බුදයට මුහුණ දීමට සිදුවේ. ඒ නිසා ඇත්ත ඇති සැටියෙන් පාරිභෝගිකයන් සමඟ සාකච්ජා කර සාධාරණ විසඳුමකට එළඹීම විදුලි බල මණඩලයේ වගකීමයි. එවිට සියළු දෙනාම බලශක්තිය සංරක්ෂණය කිරීමට පෙළඹෙනු ඇත. ඒ වෙනුවට විදුලි බල මණ්ඩලයේ ඇතැම් ඉහළ නිලධාරීන් වෑයම් කරන්නේ තොරතුරු සැඟවීමටයි. ජනතාව රැවටීමටයි. එය සතුරා හමුවේ සිය හිස සඟවාගන්නා පැස්බරාගේ උපක්‍රමයට දෙවෙනි නැත. විදුලි ගාස්තු ක්‍රමය පිළිබඳව වැඩි වැඩියෙන් පර්යේෂණය කල යුතු මේ අවදියේ විදුලි ගාස්තු සකස් කරන අංශය වසා දැමීමට මණ්ඩලය කටයුතු කිරීම ද කණගාටුවට කරුණකි. ලංකාවේ විදුලි බිලේ අර්බුදයට දිගුකාලීන විසඳුමක් ලබාගැනීමට නම් මේ පිළිබඳ යහපත් සංවාදයක් ඇති කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වේ.